# ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
# இலங்கை சாரணர் சங்கம்
# Sri Lanka Scout Association

Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement


2026.09.19 චක්‍රලේඛ අංක : **75/2026**

දිසා කොමසාරිස්තුමා
සහය දිසා කොමසාරිස් (පෝතක) වෙත,

## 11 වන ජාතික බාලදක්ෂ ජම්බෝරිය - 2027
## පෝතක බාලදක්ෂ වික්‍රමාන්විත දිනය

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය මගින් සංවිධානය කරන 11 වන ජාතික ජම්බෝරිය - පෝතක දිනය මෙවර **2027 ජනවාරි මස 20 සහ 21** යන දින වල පෙ.ව **8.00** සිට ප.ව **4.00** දක්වා ශ්‍රී ලංකාවේ හෝමාගම, දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේ දී පැවැත්වීමට කටයුතු සැලසුම් කොට ඇත. ලියාපදිංචි වූ දිස්ත්‍රික්කයන් සඳහා දින දෙකෙන් එක් දිනයක් වන පරිදි සියලු පෝතක බාලදක්ෂ දිස්ත්‍රික්ක වෙන් කර පැවැත්වීමට සංවිධායක කමිටුව තීරණය කර ඇත. ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය මේ වන විටත් 11 වන ජාතික ජම්බෝරිය - පෝතක දිනයේ සංවිධාන කටයුතු ආරම්භ කර ඇත.

### පෝතක බාලදක්ෂ සහභාගීත්වය

**සහභාගීවන්න්ගේ වයස** - සුදුසුකම්ලත් පෝතක බාලදක්ෂයින් **2026 ඔක්තොම්බර් 10** දින වන විට වයස අවුරුදු **11** නොයික්ම විය යුතු ය.

**සුදුසුකම් -** **2026 ඔක්තොම්බර් 10** වන දිනට පෙර ලෝකඩ තරු සම්පූර්ණ කර ඇති පෝතක බාලදක්ෂයින් සියලුම දෙනා ලියාපදිංචි කිරීමට දිසා වලට හැකියාව ඇත.

### පෝතක බාලදක්ෂ නායක නායිකා සහභාගීත්වය

පෝතක බාලදක්ෂ රැළක් සඳහා බලපත්‍රලාභී පෝතක නායකයෙකු හෝ නායිකාවක් සිටීම අනිවාර්ය වේ. පෝතක බාලදක්ෂයින් 05 දෙනෙක් සඳහා එක් පෝතක බාලදක්ෂ නායකයෙකු හෝ නායිකාවක් සිටීම සුදුසුය. පෝතක බාලදක්ෂ නායක නායිකාවන් සීමිතව සිටින පාසල් වල විදුහල්පත්ගේ අවසරය මත, දෙමව්පියන් මෙයට සම්බන්ධ කර ගත හැකි ය.

## ලියාපදිංචිය හා ගෙවීමේ කටයුතු

ලියාපදිංචි වන ළමුන් හා ආචාර්යවරුන් සඳහා රු 1000/- ක මුදලක් (පෝතක බාලදක්ෂයින්, පෝතක බාලදක්ෂ නායක/ නායිකාවන් සහ දෙමාපිය සම්බන්ධීකාරකවරුන් සඳහා) පාසල් සංවර්ධන සමිතිය මගින් දිසා බාලදක්ෂ සංගමයට **2026 ඔක්තොම්බර් 10 වන දිනට** පෙර ගෙවිය යුතු ය. ඉහත මුදලට නිල ක්‍රියාකාරකම් කාඩ්පත, සහභාගීත්ව සහතිකපත්‍රය සහ ජම්බෝරි පදක්කම පිරිනමනු ලැබේ.

දිසා සංගමය මගින් එකතුවන සියළු ම මුදල් **ඔක්තොම්බර් 10** වන දිනට හෝ ඊට පෙර ජාතික බාලදක්ෂ මූලස්ථානයට පහත දැක්වෙන ආකාරයට ගෙවීම කල හැකිය. ශ්‍රී ලංකා බාලදකෂ සංගමයේ මහජන බැංකු මූලස්ථාන ශාඛාවේ (**204100150085323**) යන ගිණුම් අංකයට දිසාවේ මුළු මුදලම තැන්පත් කර එම ලදු පතේ ඔබගේ නම දිස්ත්‍රික්කය සඳහන් කොට 2026 ඔක්තොම්බර් 10 දිනට හෝ ඊට පෙර පෝතක අංශයේ ලිපිකාරිණී චතුරිකා සෙව්වන්දි මහත්මියගේ ඊ මේල් ලිපිනයට පමණක් යොමු කරන ලෙස දන්වා සිටිමු.

- පාසල් මට්ටමින් හා දෙමව්පියන් විසින් වරින් වර මුදල් ගෙවීම් කටයුතු සිදු නොකිරීමට සහය දිසා කොමසාරිස් (පෝතක) හා දිසාවේ කණ්ඩායම් නායක හෝ නායිකාවක වගබලා ගත යුතු බවත් එසේ පැමිණෙන ලියාපදිංචි මුදල් භාර නොගන්නා බවත් කාරුණිකය දන්වා සිටිමි. (දිසාවේ වගකිව හැකි නායකයකු හෝ නායකාවක එක්වරම ලියාපදිංචි ගෙවීම් කල යුතු ය.)

## දිසාව භාර කණ්ඩායම් නායක/නායිකා

එක් එක් දිසාව සඳහා කණ්ඩායම් නායිකාවක් හා නායකයකු පත් කර ඔහු/ඇය ගේ විස්තර මේ සමග අමුණා ඇති පොරමය පුරවා මූලස්ථානය වෙත ඉතා ඉක්මනින් යොමු කරන්න. පෝතක බාලදක්ෂ රැළවල් වැඩි සංඛ්‍යාවක් ඇති දිස්ත්‍රික්ක සඳහා කණ්ඩායම් නායක නායිකාවන් පස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් සහය දිසා කොමසාරිස් (පෝතක) යටතේ පත් කර ගත හැකි ය. ජම්බෝරි - පෝතක දිනයට සහභාගීවන සියළු ම පෝතක බාලදක්ෂයින්ගේ විදුහල්පති හා දෙමාපිය අවසර ලිපි (සපයාඇති ආකෘති අනුව) දිස්ත්‍රික්කය මගින් ගොණුවක් පවත්වා ගත යුතුයි.

ජම්බෝරි - පෝතක දිනය පැවැත්වෙන කාල සීමාවතුල සෞඛ්‍යය අමාත්‍යංශය හා ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය නිකුත් කරන ලද **ලද** සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව ඔබ සියලු දෙනා කටයුතු කිරීමට බැඳී සිටින බව දන්වමු.

විදුහල්පති අනුමැතිය ඇතිව ආහාර/ජලය, නවාතැන්, ක්‍රියාකාරකම්, සනීපාරක්ෂක කටයුතු පිළිබඳව දෙමාපිය කමිටුවක් පත් කල යුතුයි. ආහාර හා අනෙකුත් වියදම් පිළිබඳව පාසල් සංවර්ධන සමිති ගිණුම් අනුව කටයුතු කළ යුතුයි.

**<u>අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම</u>**

- **දිසාවේ තබා ගත යුතු අයදුම්පත්**

කණ්ඩායම් නායක/නායිකා අයදුම්පත්‍රය
නායක/නායිකා අයදුම්පත්‍රය
පෝතක බාලදක්ෂ අයදුම්පත්‍රය
යන අයදුම්පත් ඔබගේ දිසාවේ පාසල් මට්ටමින් වෙන් වෙන්ව ගොණුකර තබා ගත යුතු ය.

- **ජාතික බාලදක්ෂ මූලස්ථානයට ලැබිය යුතු අයදුම්පත්**

ජම්බෝරි - පෝතක දිනයට සහභාගීවන පෝතක බාලදක්ෂයින්ගේ නම් සදහන් පෝරමය (දිස්ත්‍රික්කයේ පාසල් මට්ටමින් වෙන් වෙන්ව එවිය යුතු ය.)

දිස්ත්‍රික්කයේ සියළු ම පාසල් වල සාරාංශගත ලිපි ශීෂ වාතාවක්

ජාතික බාලදක්ෂ මූලස්ථානයට 2026 ඔක්තොම්බර් 10 දිනට හෝ ඊට පෙර එවීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි. (සියළුම අයදුම්පත්‍රවල පිටපත් දිස්ත්‍රික් මූලස්ථාන වල තබා ගන්න.)

**<u>සෞඛ්‍ය තත්වය</u>**

ආකේලා පෝතක දරු දැරියන්ගේ සෞඛ්‍ය තත්වයන් සම්බන්ධයෙන් දැනුම්වත් ව සිටිය යුතුය. (අසාත්මිකතාවයන් හෝ වෙනත් රෝගී තත්වයන් පිළිබදව වෛද්‍ය වාර්තා ලබා ගන්න.) පෝතක දැරියන් සඳහා කාන්තා ආචාර්යවරියන් භාරව කටයුතු කිරීම අනිවාර්ය වේ. තම විදුහල අයිති වන සෞඛ්‍ය වෛද්‍යය නිළධාරී කාර්යාලයෙන් මෙම වැඩසටහන සඳහා අවසර ලබා ගත යුතුය.

වැඩි විස්තර ඉදිරියේ දී චක්‍ර ලේඛනයක් මගින් දැනුම් දෙනු ලැබේ.

ස්තුතියි,
මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

*චන්ද්‍රාණි ප්‍රනාන්දු*
සහය ප්‍රධාන කොමසාරිස්
(සිඟිති,පෝතක හා බාලදක්ෂ බාලිකා)

*නිතිශ මනෝජ් නානායක්කාර*
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්